# ප්‍රජා මණ්ඩල ලියාපදිංචිය හා නියාමනය කිරීමේ ක්‍රියාවලිය



## 07.1 හැඳින්වීම

බල ප්‍රදේශයේ පිහිටි ගම්වල ආර්ථික, ආගමික, සංස්කෘතික, අධ්‍යාපනික හා සමාජයීය සංවර්ධනය ඇතිකිරීම හා පාරිසරික සංරක්ෂණයට අදාළ වැඩසටහන් සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම. විශේෂයෙන් තරුණ කොටස්වලට විවේක කාලය අර්ථවත් වන අයුරින් ගත කිරීමට ඉවහල් වන වැඩ සටහන් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම හා සේවා වියුක්තිකයන්ට අදාළ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම.

## 07.2 නෛතික අධිකාරිය

I. පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 1977.10.10 දිනැති ප්‍රජා මණ්ඩල පිහිටුවීම පිළිබඳ උපදේශ මාලාව.
II. 2013 වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ප්‍රජා මණ්ඩල පිහිටුවීම හා ඊට අදාළ කාර්යභාරය පිළිබඳ උපදේශ මාලාව.

## 07.3 සුදුසුකම්

I. ශ්‍රී ලංකා ජන රජයේ පුරවැසියෙකු වීම.
II. වයස අවු: 18 ට වැඩි විය යුතුය. නිලධාරීන් 18 ට වැඩිවිය යුතුය.
III. බල ප්‍රදේශය තුළ පදිංචිකරුවෙකු හෝ දේපළ හිමියෙකු හෝ රැකියා කරන්නෙකු වීම.

## 07.4 ගාස්තු අයකිරීම

ප්‍රජා මණ්ඩලය විසින් අනුමත කරගන්නා ලද සාමාජික මුදල වේ.

## 07.5 ඉදිරිපත් කළ යුතු ලේඛන

ප්‍රජා මණ්ඩල ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය.

## 07.6 කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | වගකීම |
|---|---|---|---|
| 1 | එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශයකට අවම වශයෙන් එක් ප්‍රජා මණ්ඩලයක් වත් පිහිටවීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම. | කඩිනමින් | සභාපති/ලේකම් |
| 2 | ප්‍රජා මණ්ඩලය පිහිටවීම සඳහා මහජන රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. | කඩිනමින් | ප්‍රජා සංවර්ධන නිලධාරී |
| 3 | ප්‍රජා මණ්ඩලය සඳහා නිලධාරීන් පත්කිරීමට සහය ලබා දීම. | ප්‍රජා මණ්ඩල රැස්වීම දින | ප්‍රජා සංවර්ධන නිලධාරී |

| | | | |
|---|---|---|---|
| 4 | මහ සභාවට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රජා මණ්ඩල රැස්වීම් වාර්තා හා අවශ්‍ය ලේඛන ගෙන්වා ගැනීම හා මහ සභා අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ලියාපදිංචිය සඳහා සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීම. | දින 45 ඉකුත් වීමට පෙර. | ලේකම්/ප්‍රජා සංවර්ධන නිලධාරී |
| 5 | අදාළ සුදුසුකම් සපුරා ඇති ප්‍රජා මණ්ඩල සඳහා ලියාපදිංචි සහතිකය ලබා ගැනීම. | දින 14 තුළ දී. | ලේකම් |
| 6 | පළාත් පාලන ආයතනය විසින් මහා සභාවේ අනුමැතිය යටතේ ප්‍රජා මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා ප්‍රජා මණ්ඩල අතුරු කාරක සභාව පත් කිරීම. | වර්ෂයකට | සභාපති/ලේකම්. |
| 7 | ප්‍රාදේශිය සභාව විසින් අවස්ථානුකූලව හා මහජන පැමිණිලි යොමු වීම අනුව අධීක්ෂණයක් සිදුකිරීම සඳහා ප්‍රජා මණ්ඩල අතුරු කාරකසභාව වෙත යොමු කිරීම. | අවස්ථානුකූලව | සභාපති/ලේකම් |
| 8 | ප්‍රජා මණ්ඩල අතුරු කාරක සභා වාර්ථා මහ සභාව වෙත යොමු කර නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම. | දින 45 | ප්‍රජාමණ්ඩල අතුරු කාරකසභාව |
| 9 | ප්‍රජා මණ්ඩල අතුරු කාරක සභාව විසින් අක්‍රිය ප්‍රජා මණ්ඩල සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කරගත් කල්හි ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කිරීම. | කරුණු තහවුරු වූ අවස්ථාවේ දී. | සභාපති/ලේකම්. |